# උක් පර්යේෂණ ආයතනය - 2010

------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, උක් පර්යේෂණ ආයතනය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට උක් පර්යේෂණ ආයතනයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරන අඩුපාඩු නිරීක්ෂණය විය.

භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු සඳහා පිළිවෙලින් රු.6,472,579 ක් හා රු.1,381,022 ක් ලෙස එකතුව රු.7,853,601 ක් වූ 2011 වර්ෂය සඳහා අදාල පොළිය 2010 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල විලම්බිත බැරකම් යටතේ හා ලැබිය යුතු පොළි ආදායම් යටතේ දක්වා තිබුණි.

### 1.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

#### 1.3.1 ලැබිය යුතු ගිණුම්

රු. 1,815,445 ක් වූ ණයගැතියන් අවුරුද්දට වඩා වැඩි කාලයක සිට පවතින අතර රු. 5,100 ක් වූ ණයගැති ශේෂය අවුරුදු 5ට වැඩි කාලයක සිට ඉදිරියට ගෙනවිත් තිබුණි.

#### 1.3.2 ගෙවිය යුතු ගිණුම්

ශ්‍රී ලංකා සීනි සංස්ථාවට ගෙවිය යුතු රු.2,700,020 ක මුදල වර්ෂ 05 ක් ඉක්මවා තිබුණද එම ණය පියවීමට කටයුතු කර නොතිබුණි.

### 1.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

පිළිවෙලින් රු. 4,820,545 ක් හා රු. 4,278,440 ක් වු ණයගැති හා ණයහිමි සඳහා ව ශේෂ සනාථ කිරීම නොලැබීම නිසා ඒවායේ නිරවද්‍යතාවය විගණනයේ දි තහවුරු කරගත නොහැකිවිය.

### 1.5 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

1971 අංක 38 දරණ මුදල් පනතේ 11 වගන්තිය හා 2005 දෙසැම්බර් 09 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 33 ප්‍රකාර මහා භාණ්ඩාගාර අනුමැතිය නොලබා ආයතනයේ අරමුදලින් රු.32,000,113 ක් සමාලෝචිත වර්ෂය අවසන් දිනට ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

## 02 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු. 29,929,279 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ රු. 24,987,470 ක අතිරිකතයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු. .4,941,809 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. 2009 වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂයේදි සෙස් ආදායම රු.13,022,567 කින් වැඩිවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය විසින් සියඹලාණ්ඩුවේ අක්කර 05 ක් වු භූමියේ සංවර්ධන කටයුතු සිදුකර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම ඉඩම්වල නිත්‍යාණුකූල අයිතිය ආයතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයෙ ප්‍රතිපාදන භාවිතා කරමින් මෝටර් රථයක් හා මගී බස් රථයක් මිලදී ගැනීමට පිළිවෙළින් රු.මිලියන 3 ක් හා රු. මිලියන3.5 කට භාණ්ඩාගාර අනුමැතිය ලැබී තිබුණද එය නොසලකා පළිවෙළින් රු . මිලියන 5 ක් හා රු. මිලියන 7.9 ක් වැය කරමින් ඉහත වාහන මිලදී ගැනීම නිසා අනුමත වැය සීමාව රු.මිලියන 6.4 කින් ඉක්මවා වැයකර තිබුණි.

### 2.3 නිෂ්කාර්ය වත්කම් හා ඌණ උපයෝජිත වත්කම්

රු.මිලියන 02ක් වියදම් කර සකස් කල මීරුට් උදුන භාවිතයට නොගෙන නිෂ්කාර්යව තිබුණි. ඒ වෙනුවට උක් හකුරු නිෂ්පාදනය සඳහා සාම්ප්‍රදායික උදුන භාවිතා කර තිබුණි.

## 2.4 සීනි නිෂ්පාදනය හා ආනයනය

උක් වැවීම හා වගාකිරීම සම්බන්ධයෙන් හා එයින් යම් නිෂ්පාදනයක් සෑදීම සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම තුලින් උක් නිෂ්පාදනයේ ඵලදායීතාවය වැඩි කිරීම උක් පර්යේෂණ ආයතනය පිහිටුවීමේ එක් ප්‍රධාන අරමුණක් වවද සමාලෝචිත වර්ෂයේදී එම අරමුණ මුදුන්පත් කරගෙන තිබේද යන්න ප්‍රශ්නගතව තිබුණි. දේශිය සිනි නිෂ්පාදනය හා සීනි ආනයන ප්‍රමාණයන් පිළිබද පසුගිය වර්ෂ 11 ක දත්ත පහත විග්‍රහ කර දක්වා ඇත.

| වර්ෂය | දේශිය සීනි නිෂ්පාදනය | ආනයන සනි ප්‍රමාණය | මුළු සිනි ප්‍රමාණය | මුළු සිනි ප්‍රමාණයෙන් දේශිය නිෂ්පාදිතයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | මෙ.ටො. | මෙ.ටො. | මෙ.ටො. | % |
| 2000 | 48,000 | 562,000 | 610,000 | 7.87 |
| 2001 | 64,000 | 420,000 | 484,000 | 13.22 |
| 2002 | 39,000 | 554,000 | 593,000 | 6.58 |
| 2003 | 54,000 | 509,000 | 563,000 | 9.59 |
| 2004 | 60,000 | 438,000 | 498,000 | 12.05 |
| 2005 | 54,000 | 418,000 | 472,000 | 11.44 |
| 2006 | 56,000 | 525,000 | 581,000 | 9.64 |
| 2007 | 30,000 | 481,000 | 511,000 | 6.24 |
| 2008 | 39,000 | 575,000 | 614,000 | 6.35 |
| 2009 | 32,000 | 467,000 | 499,000 | 6.41 |
| 2010 | 31,500 | 559,000 | 590,500 | 5..33 |

ඉහත දත්ත අනුව ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තය දශක 04 කට අධික කාලයක් පුරා පැවතියද දේශිය සීනි නිෂ්පාදනයෙන් දායක වන්නේ රටේ සමස්ථ සීනි අවශ්‍යතාවයෙන් දළ වශයෙන් 7 % ක් තරම් අඩු අගයක් ගෙන තිබූ බව පසුගිය ආසන්න වර්ෂ 04 ක දත්ත නිරීක්ෂණයෙන් හෙලිවේ.

## 2.5 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

(අ.) සමාලෝචිත වර්ෂයේදී ශ්‍රවනාගාරයක් ඉදිකිරීම සඳහා රු.25,000,000 ක් වෙන් කර තිබුණද එම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අතහැර දමා තිබුණි.

(ආ.) සමාලෝචිත වර්ෂය තුල ආයතනය තුල ක්‍රියාත්මක පහත සඳහන් ව්‍යාපෘති කාර්යයන් හි මුල්‍ය කාර්යසාධනය ඉතාමත් පහල අගයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| ව්‍යාපෘතිය | අයවැය අනුව වෙන්කිරීම | 2010.12.31 දිනට තථ්‍ය ආදායම/ වියදම | මූල්‍ය කාර්යසාධනය |
|---|---|---|---|
| | රු. | රු. | % |
| උක් බීජ හා දඬු විකිණීම | 1,500,000 | 487,585 | 33 |
| <u>යටිතල පහසුකම් හා සංවර්ධන ව්‍යාපෘති</u> | | | |
| පර්යේෂණ ද්‍රව්‍ය, පොහොර, වෙනත් | 6,585,000 | 3,234,853 | 49 |
| කාර්ය මණ්ඩල පුහුණුකිරීම | 500,000 | 70,564 | 14 |

03 **<u>පද්ධති හා පාලන</u>**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ.) ගිණුම්කරණය
(ආ.) කාර්යය මණ්ඩල
(ඇ.) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
(ඇ.) වත්කම් උපයෝජනය